ඒකකය 01 - ශ්‍රී ලංකාවේ සංවර්ධනයට කෘෂිකර්මයේ දායකත්වය

## I - කොටස

✍ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1) අනුරාධපුර යුගයේ ඉදි කෙරුණු ප්‍රථම වැව නම් කරන්න.

i. මින්නේරිය වැව ii. කලා වැව iii. බසවක්කුලම වැව iv.තිසා වැව

2) රජරට වැව් පද්ධතිය ස්වභාවික පෝෂිත ප්‍රදේශ ආශ්‍රිතව එකිනෙකට සම්බන්ධ ජලාශ සමූහයක් වශයෙන් නිර්මාණය කර තිබූ අතර එක් වැවකින් පෝෂණය වන ප්‍රදේශය ඊළඟ වැවේ පෝෂක ප්‍රදේශය ලෙස පවත්වාගෙන යන ලදි.මෙය හඳුන්වනු ලබන්නේ

i. වාරි මාර්ග ඇළ ii. වැව් බැම්ම iii. වැව් ඉස්මත්ත iv. තිසා වැව

3) විදේශ ආක්‍රමන වලින් බිඳ වැටුණු දේශීය ආහාර නිෂ්පාදනය නැංවීම සඳහා 1912 දී පිහිටුවන ලද දෙපාර්තමේන්තුව,

i. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
ii. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
iii. වාරි මාර්ග දෙපාර්තමේන්තුව
iv. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුව

4) කිසියම් වර්ෂයක් තුළ රටක නිෂ්පාදනය කරනු ලබන සියලුම භාණ්ඩ හා සේවා වල වටිනාකම වන්නේ

i. දළ දේශීය නිෂ්පාදනය ii. ජාතික ආදායම
iii. නිෂ්පාදන පිරිවැය iv. ඒක පුද්ගල ආදායම

5) අවශ්‍ය අවස්ථාවක දී අවශ්‍ය ප්‍රමාණ වලින් නියමිත ගුණාත්මයෙන් යුක්තව අවශ්‍ය ආහාර වර්ගයක් ලබා ගැනීමට ඇති හැකියාව වනුයේ,

i. ආහාර පරිරක්ෂණය ii. ආහාර සුරක්ෂිතතාව
iii. ආහාර සුභලතාව iv. ප්‍රයෝජනයට ගැනීම

6) ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය පිහිටා ඇත්තේ,

i. අගලවත්ත ii. බතලගොඩ iii. තලවකැලේ iv.ලුනුවිල

7) ලංකාවට නිදහස ලැබීමෙන් පසු ආරම්භ කරන ලද බහු කාර්ය ගොවිජනපද ව්‍යාපාරය වන්නේ,

i. මහවැලි යෝජනා ක්‍රමය ii. ලුනුගම් වෙහෙර ක්‍රමය
iii. ඉඟිනිමිටිය ක්‍රමය iv. ගල්ඔය ක්‍රමය

8) වියළි කලාපයේ සංවර්ධනය සඳහා ආරම්භ කරන ලද කඩිනම් යෝජනා ක්‍රමය වනුයේ,

i. ලුනුගම් වෙහෙර ii. මහවැලි යෝජනා ක්‍රමය
iii. මුතුකණ්ඩිය යෝජනා ක්‍රමය iv. මව්ආර යෝජනා ක්‍රමය

9) වාරි තාක්ෂණයේ දියුණුවත් සමගම වැව් බැම්මට ජලය මගින් ඇති වන පීඩනය අවම කිරීමට ඉදි කරන ලද සුවිශේෂී නිර්මාණය වනුයේ ,

i. සොරොව්ව ii. බිසෝ කොටුව iii. වැව් ඉස්මත්ත iv. පිටවාන

10) ශ්‍රී ලංකාව පෙරදිග ධාන්‍යාගාරය යන විරුදාවලිය ලැබීම මගින් අතීතයේ ස්වයංපෝෂිත කෘෂි ආර්ථික රටාවක් තිබූ බව පැහැදිලිය. මෙම විරුදාවලිය ලැබී තිබුනේ කුමන රජු සමයේ ද?

i. ධාතුසේන රජතුමා ii. පන්ඩුකාභය රජතුමා
iii. මහා පරාක්‍රමබාහු රජතුමා iv. දුටුගැමුණු රජතුමා

## II කොටස

1)

I. උතීතයේ සිට ම ශ්‍රී ලංකාවේ ස්වයංපෝෂිත කෘෂි ආර්ථික රටාවක් පැවතුනි. ශ්‍රී ලංකාවේ දියුණු කෘෂි කර්මාන්තයක් පැවති බවට සාක්ෂි 04ක් ලියන්න.

II. යැපුම් කෘෂි කර්මාන්තයේ ලක්ෂණ මොනවාද?

III. විදේශ ආක්‍රමණය නිසා දේශීය කෘෂි කර්මාන්තයට සිදු වූ බලපෑම් 03ක් ලියන්න.

2) ඉදිකිරීම් තාක්ෂණයේ දියුණුවත් සමග ආරම්භ කරන ලද "මහවැව්" අතීතයේ බිහි වූ සුවිශේෂී නිර්මාණ වේ.

I. වැවක ප්‍රධාන කොටස් නම් කර ඒ එකිනෙකින් ඉටුවන කාර්යයන් ලියන්න.

II. ප්‍රධාන වැව් 03ක් නම් කර ඒවා කරවූ රජවරු නම් කරන්න.

III. අතීතයේ දී ගොවිතැන් කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය දැක්වූ අවස්ථාවක් සඳහා ලියන්න.

3)

I. හැටේ දශකයේ අගභාගයේ දී ආරම්භ කරන ලද කෘෂි සංවර්ධන යෝජනා ක්‍රම වල අරමුණු 04ක් ලියන්න.

II. හැටේ දශකයේ අගභායේ දී ආරම්භ වූ හරිත විප්ලවය නිසා සිදු වූ වෙනස්කම් මොනවාද?

III. දල දේශීය නිෂ්පාදනයට අයත් ප්‍රධාන අංශ 03ක් නම් කරන්න.

IV. ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය සඳහා පවතින විභව 04ක් නම් කරන්න.

10 ශ්‍රේණිය

**ගාල්ල අධ්‍යාපන කලාපය**
**ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2018**
**කෘෂි හා ආහාර තාක්ෂණය**

Agriculture Section

**ඒකකය 01 - ශ්‍රී ලංකාවේ සංවර්ධනයට කෘෂිකර්මයේ දායකත්වය - පිළිතුරු පත්‍රය**

## I කොටස

1) iii
2) iv
3) ii
4) i
5) ii
6) iii
7) iv
8) ii
9) ii
10) iii

## II කොටස

1) (I)

- විජය කුමරු සමඟ පැමිණි 700ක් පිරිසට ගබඩාවලින් සහල් රැගෙන රසවත් ආහාර වේලක් කුවේනිය නැමති ප්‍රාදේශීය පාලිකාව සකස් කර දීම.
- පන්ඩුකාභය කුමරුට පාලි නම් කුමරිය හමුවූයේ කෙතක වැඩ කරමින් සිටි ඇගේ පියා වෙත ඇඹුල ගෙන යන අතරතුරය.
- ඌව පලාත තුල වෙල් ලක්ෂයක් තිබූ නිසා වෙල්ලස්ස යන නම ජනප්‍රවාදයේ පැවතෙයි.
- පැරකුම්භා රජ සමයේ ශ්‍රී ලංකාව පෙරදිග ධාන්‍යාගාරය යන විරුධාවලිය ලැබීම මගින් අතීතයේ ස්වයංපෝෂිත ආර්ථික රටාවක් තිබූ බව පැහැදිලි වේ.

(II)

- තම පවුලේ ශ්‍රමය භාවිතා කිරීම.
- තමාගේ පරිභෝජනය සඳහා පමණක් භාණ්ඩ නිෂ්පාදනය කිරීම.
- පැරණි කෘෂි කාර්මික ක්‍රම භාවිතා කිරීම.
- කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතා නොකිරීම.
- ගොවිපල වාර්තා තබා නොගැනීම.

(III)

- වාණිජ කෘෂි කර්මාන්තය බිහි වීම.
- බ්‍රිතාන්‍යයන් විසින් වැවිලි බෝග හඳුන්වා දීම.
- මුඩුබිම් පනත යටතේ සියලුම කැලෑ මුඩු ඉඩම් වගා නොකළ ඉඩම් රජයට පවරා ගැනීම.මෙම ඉඩම් ඉතා අඩු මිලකට වැවිලි භෝග වගාව සඳහා විකුනන ලද අතර ඒ සඳහා බදු සහන ද ලබා දී ඇත.

2) (I) වැව් බැම්ම - වැව ආරක්‍ෂා කිරීම

සොරොව්ව - වැඩි ජලය පිට කිරීම.

බිසෝ කොටුව - ජලය මගින් ඇතිවන පීඩනය අවම කිරීම

වැව් ඉස්මත්ත - ජල පෝෂක ප්‍රදේශ රැක ගැනීම

රැළ පනාව - වැව් බැම්මට ජල තරංග වලින් පීඩනය සහ බාදනය වැලැක්වීම

(II)

| | |
|---|---|
| මින්නේරිය වැව | - මහසෙන් රජු |
| කලාවැව | - ධාතුසේන රජු |
| පරාක්‍රම සමුද්‍රය | - පන්ඩුකාභය රජු |
| අභය වැව | - පන්ඩුකාභය රජු |

(III) මහසෙන් රජු මින්නේරිය දෙවියන් ලෙස දේවත්වයෙන් පුදනු ලැබුවේ මින්නේරිය වැව ඉදි කල නිසාය.

3) (I)

- කෘෂි නිෂ්පාදන ඉහල දැමීම.
- ඉඩම් නැති අයට ඉඩම් ලබා දීම.
- ජල විදුලිය සැපයීම.
- රැකියා සැපයීම
- ජනශුන්‍ය ප්‍රදේශ වල ජනයා පදිංචි කරවීම.

(II)

- කෙටි කාලයක් තුළ වැඩි අස්වනු ගෙන දෙන බීජ වර්ග හඳුන්වා දීම.
- කෘෂි රසායන ද්‍රව්‍ය හඳුන්වා දීම.
- ගොවිපල යාන්ත්‍රිකරණය වැඩි වීම.
- කන්න 1ක් වෙනුවට කන්න 2ක් වගා කිරීම.
- ලෝක ධාන්‍ය නිෂ්පාදනය ආසන්නන වශයෙන් දෙගුණයකින් වැඩි වීම.

(III)

i. කාර්මික අංශය
ii. කෘෂි කාර්මික අංශය
iii. සේවා අංශය

(IV) ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය සඳහා ඇති විභව

i. කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය සම්පත් සුලභ වීම.
ii. කෘෂි කර්මාන්තය සඳහා හිතකර පරිසර තත්ව පැවතීම.
iii. කෘෂි කාර්මික නිෂ්පාදන සඳහා දේශීය හා විදේශීය වෙළඳ පොළක් පැවතීම.
iv. කෘෂි කර්මාන්තයට හිතකර වූ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම.